නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ව්‍යාපාරය
சுதந்திரமானதும் நீதியானதுமான தேர்தலுக்கான மக்கள் இயக்கம்
Campaign for Free & Fair Elections
CaFFE
No. 100/19-A, Welikadawatta Road, Rajagiriya.
Tel: 0114 341 514,Fax: 0112866 224
E-mail: caffe2008@gmail.com

2018 ජනවාරි 2

මහින්ද දේශප්‍රිය මහතා,

මැතිවරණ කොමිෂන් සභාව,

සරණ පාර, රාජගිරිය.

සභාපතිතුමනි,

ජනමාධ්‍ය වෙත යොමු කළ උපමාන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අග්‍රාමාත්‍ය කාර්යාලය නිකුත් කර ඇති නිවේදනයේ පිටපතක් මේ සමග අමුණා ඇත.

මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කළ මාධ්‍ය උපමාන මාස 3 ක් ඇතුලත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ව්‍යවස්ථාමය අවශ්‍යතාවකි. ඒ සඳහා පහසුකම් සැලසීම අදාළ විෂයභාර අමාත්‍යාංශය හා අමාත්‍යවරුන්ගේ වගකීමකි. එමෙන්ම එවැන්නක් විධිමත් කාර්ය පටිපාටියකින් පසුව ප්‍රතික්ෂේප කිරීමේ අවස්ථාව ද, ව්‍යවස්ථාදායක සතු බලයක් හා අයිතියකි.

'මැතිවරණ කොමිෂන් සභාව විසින් ගැසට් මගින් ප්‍රකාශයට පත් කළ මාධ්‍ය උපමාන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අත්සන් තැබීම' යැයි මාධ්‍ය අවස්ථාවක් (Media Event) නිර්මාණය කර එය '**<u>එළඹෙන මැතිවරණයේ දී සියලු දෙනා ආණ්ඩුවට සහාය ලබා</u>** <u>දීම සඳහා</u> ආයාචනා කිරීම සඳහා අවස්ථාවක් කර ගැනීම' කොමිෂන් සභාව සිදු කළ පරිපාලන හා බලයලත් කාර්යයක් මගින් අනියම් ආකාරයෙන්

දේශපාලන වාසියක් ලබා ගැනීමකි. පළාත් පාලන ඡන්ද විමසීම සඳහා ඉදිරිපත්වන දේශපාලන පක්ෂ නායකයෙකු අග්‍රාමාත්‍යවරයා ලෙස ඉහත ප්‍රකාශය සිදු කිරීම තුල 'මාධ්‍ය උපමාන නිකුත් කිරීම' අග්‍රාමාත්‍යවරයා හෝ ඔහුගේ ආණ්ඩුව විසින් සිදු කළ කාර්යයක් බව සෘජුව හා වක්‍රව සමාජගත කිරීමට දරන උත්සාහයකි.

මැතිවරණ කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන නිවේදන/උපමාන /මාර්ගෝපදේශ හෝ එවැනි වෙනත් දැන්වීම් මගින් පළාත් පාලන මැතිවරණයට ඉදිරිපත්වන කිසිදු දේශපාලන පක්ෂයක්, කණ්ඩායමක් හෝ ස්වාධීන කණ්ඩායමක් සෘජු හෝ වක්‍ර දේශපාලන වාසියක් ලබා ගැනීම වැලැක්වීම සඳහා 'මැතිවරණ කොමිෂන් සභාවේ' ක්ෂණික අවධානය යොමු කරන ලෙස කාරුණිකව ඉල්ලමි.

මෙයට විශ්වාසී,

කීර්ති තෙන්නකෝන්

විධායක අධ්‍යක්ෂ/කැෆේ සංවිධානය

පිටපත්

1. සමන් ඒකනායක මහතා - අග්‍රාමාත්‍ය ලේකම්තුමා
2. ලේකම්, මැතිවරණ කොමිෂන් සභාව - කරුණාකර මැතිවරණ කොමිෂන් සභාවේ කාරුණික අවධානය යොමු කිරීම උදෙසා
3. අධ්‍යක්ෂ ජෙනරාල් - මැතිවරණ කොමිෂන් සභාව
4. සියළුම ජනමාධ්‍ය